**කාන්තා ප්‍රබෝධය ගුවන්විදුලි වැඩසටහන - 2019**

වර්තමාන කාන්තාව තම පවුලටත් සමාජයටත් රටටත් ඉටු කරන්නේ මිල කළ නොහැකි අගනා සේවයකි. ඇය තම සාම්ප්‍රදායික භූමිකාවන් වන සැමියාට සැලකීම, දරුවන් බිහි කිරීම, පෝෂණය හා රැකබලා ගැනීම, මුළු නිවසේම ආහාර සෞඛ්‍ය මෙන්ම දරුවන්ගේ අධ්‍යාපනය ආදී වගකීම් දැරීමෙන් ඔබ්බට ගොස් තම පවුලට ආර්ථික වශයෙන් දායකවනු වස් රැකියාවක හෝ යම් ආදායම් උපයන මාර්ගයක නියැලීම සමාජමය වශයෙන් විවිධ තනතුරු හා වගකීම් දරමින් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන් දරණ වගකීම් සමූහය සුළුපටු නොවන අතර රටේ සංවර්ධනය උදෙසා ඇය විසින් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මේ අනුව කාන්තාවන් උගත් බුද්ධිමත් දක්ෂ මෙන්ම ආර්ථික වශයෙන් ද ශාරීරිකහා මානසික වශයෙන් ද ශක්තිමත් වීම වැදගත්ය. එමනිසා ඇයව දැනුවත් කිරීමේ අරමුණින් කාලීන මාතෘකා ඔස්සේ ගුවන් විදුලි මාධ්‍ය හරහා ඇයව දැනුවත් කිරීමේ අරමුණින් ජාතික කාන්තා කමිටුව විසින් “කාන්තා ප්‍රබෝධය” මැයෙන් සාකච්ඡාමය වැඩසටහන් මාලාවක් ප්‍රචාරය කිරීමට කටයුතු සූදානම් කර ඇත. මෙම වැඩසටහන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවයේ මෙන්ම තෙන්ඩ්‍රල් එෆ් එම් සේවයේ ද පහත සඳහන් මාතෘකා ඔස්සේ ප්‍රචාරය වනු ඇත. මෙම වැඩසටහන් ප්‍රචාරය වන පිළිවෙල වෙනස්වීමට ඉඩ ඇති බව කාරුණාවෙන් සලකන්න.

**සිංහල මාධ්‍ය වැඩසටහන්**

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව - ස්වදේශීය සේවය - 91.7FM / 91.9FM - පෙ.ව. 10.30

| | |
|---|---|
| 2019 සැප්තැම්බර් 04 | කාන්තාව කෙරෙහි වන මුස්ලිම් නීතිය කෙලෙස සංශෝධනය විය යුතුද? |
| 2019 සැප්තැම්බර් 18 | අබාධ සහිත කාන්තාවන් බලගැන්වීම |
| 2019 ඔක්තෝබර් 02 | ජාතික කාන්තා ප්‍රතිපත්තිය |
| 2019 ඔක්තෝබර් 16 | සයිබර් අපරාධ හා කාන්තාව |
| 2019 නොවැම්බර් 06 | කාන්තාව මුහුණපාන ක්ෂුද්‍ර මූල්‍ය ණය ගැටළුව |
| 2019 නොවැම්බර් 20 | 1938 කාන්තා උපකාරක දුරකතන සේවාව |

**දෙමළ මාධ්‍ය වැඩසටහන්**

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව - තෙන්ඩ්‍රල් එෆ් එම් - 104.7FM / 104.9FM - පෙ.ව. 10.30

| | |
|---|---|
| 2019 ඔක්තෝබර් 01 | කාන්තාව කෙරෙහි වන මුස්ලිම් නීතිය කෙලෙස සංශෝධනය විය යුතුද? |
| 2019 ඔක්තෝබර් 15 | 1938 කාන්තා උපකාරක දුරකතන සේවාව |